# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/8 – 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා – 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් සිදු කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ආරිය බී. රැකව වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරිණී ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2018.10.09 වන දින සිට ඌව පළාත් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන (ද්‍රවිඩ පාසල් හැර), පළාත් පාලන විදුලිබල හා බලශක්ති, ඉඩම්, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2019.10.08 දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක්, කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම.

2. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය නිමල් ශාන්ත ගමගෙදර මහතා, 2018.10.13 දින සිට 2018.11.05 දින දක්වා විදේශගත වන බැවින් 2018.10.13 දින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, වෛද්‍ය නිලධාරි (බෝනොවන රෝග) වශයෙන් සේවයේ නියුතු, වෛද්‍ය වයි. උපසේන මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරි කටයුතුවලට අතිරේකව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

1A – PG4346 – 57(2018/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) එම්. එම්. ආනන්ද විජිත කුමාර මාපා මහතා 2018.10.31 වන දින සිට 2018.11.03 දින දක්වා විදේශගත වන බැවින්, 2018.10.31 දින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III වන පන්තියේ නිලධාරි ආර්. එම්. දයාරත්න මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

4. බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ජේ. සී. එම්. තෙන්නකෝන් මහත්මිය 2018.10.28 දින සිට 2018.11.03 දින දක්වා විදේශගත වන බැවින් 2018.10.28 දින සිට ඇය නැවත දිවයිනට පැමිණෙන තෙක්, අතිරේක ප්‍රාදේශීය විශේෂඥ දන්ත වෛද්‍ය කේ. කේ. යූ. එන්. ධර්මසිරි මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරි කටයුතුවලට අතිරේකව, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

5. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, 2018.01.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම්, සමුපකාර සහ ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත් කිරීමට.

**ආරිය බී. රැකව,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2018 දෙසැම්බර් මස 28 වැනි දින,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

01 – 302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.